2026 මාර්තු

# හලම් රෝඩ් ප්‍රජා යාවත්කාලීන කිරීම




අපගේ ප්‍රජා යාවත්කාලීන කිරීමේවෙබ් පිටුවට සෘජු සබැඳියක් සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න.

හලම් රෝඩ් ලැන්ඩ්ෆිල් Veolia කණ්ඩායම, බිම්-පිරවුම් සමෝච්ඡ රේඛා සඳහා යෝජිත සංවර්ධන බලපත්‍ර සංශෝධනය පිළිබඳව ඔබට දැනුම දීමට කැමතියි.

*මෙම ප්‍රවෘත්ති පත්‍රිකාව මගින් බිම්-පිරවුම් ස්ථානය, යෝජිත සමෝච්ඡ වෙනස් කිරීම, සහ සංශෝධන ක්‍රියාවලිය පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයන අතර ප්‍රතිචාර හා විමසීම් සඳහා ඇමතුම් තොරතුරු බෙදාහදා ගනු ලැබේ. මෙය 2023 දී ආරම්භ වූ නියැලීමේ ක්‍රියාවලියක පසු විපරමක් වන අතර නව සමෝච්ඡ වෙනසක් නොවේ.*

## නැවත බැලීම: බිම්-පිරවුම් සමෝච්ඡ වෙනස් කිරීම්

*දැනට ඉදිවෙමින් පවතින අවසාන බිම්-පිරවුම් පාත්තිය සමඟ, හලම් රෝඩ් ලැන්ඩ්ෆිල් එහි සක්‍රිය බිම්-පිරවුමේ අවසන් අදියරට පිවිසෙමින් සිටී. මෙම අවසාන අදියරවල කොටසක් ලෙස, 14B, 15 හා 16 යන බිම්-පිරවුම් පාත්තිවල සමෝච්ඡ සකස් කිරීමේ ක්‍රියාවලියේ Veolia නිරතව සිටී. මෙම වෙනස්කම් මගින් පුළුල් භූමි දර්ශනයක් ලබා දෙන සහ භූගත වැසි ජල කළමනාකරණය සඳහා සහාය වන සමතල භූමි මතුපිටක් ලැබෙනු ඇත. ප්‍රදේශය ප්‍රකෘතිමත් කළ පසු, එය කවුන්සිලයට ආපසු ලබා දීමට පෙර, ඔවුන් විසින් ඉඩමේ විනෝදාත්මක භාවිතය වැඩිදියුණු කරනු ඇත.*

දැනට පවතින 14B සහ අවසාන 15 හා 16 යන පාත්ති තුළ අපද්‍රව්‍ය බහාලීම හරහා සමෝච්ඡය ළඟා කර ගනු ඇත. මෙම වෙනස මගින් සමස්ත උසට බලපෑමක් නොවී, පාත්ති අතර ප්‍රදේශ සමතල වනු ඇත.

බිම්-පිරවුම් ගෑස් කළමනාකරණ සැලැස්මට අනුකූලව බිම්-පිරවුම් ගෑස් යටිතල පහසුකම් නඩත්තු කරනු ලබන අතර, 14B, 15 හා 16 යන පාත්තිවල භූගත වැසි ජලධාරක ප්‍රදේශවලට සමෝච්ඡ මගින් බලපෑමක් නොවනු ඇත. අඩවියේ වාණිජ අපද්‍රව්‍ය ගිවිසුමට අනුකූලව, අපද්‍රව පිරිපහදු උපකරණ භාවිතයෙන් කාන්දු වූ අපද්‍රව අල්ලා ගැනීම, පිරිපහදු කිරීම, පරීක්ෂා කිරීම, ස්වාධීනව තක්සේරු කිරීම සහ ඒවා පල්දෝරු කාණුවට මුදා හැරීම දිගටම සිදු කෙරේ.

සමෝච්ඡ ළඟා කර ගත් පසු, අපද්‍රව්‍ය, කාන්දුවූ අපද්‍රව සහ කාබනික ගෑස් කළමනාකරණය හා ගබඩා කිරීම සහතික කිරීම සඳහා අවසාන ආවරණ සහ සිරස් ගෑස් ළිං යොදා ගනු ලැබේ. නාර් වොරෙන් සවුත් සිට දෘශ්‍යමාන වන අඩවියේ නැගෙනහිර මායිමේ දෘශ්‍යමය මුහුණුවර වැඩිදියුණු කරමින් සියලුම ප්‍රදේශවල තෘණ වගාව ද සිදු කරනු ලැබේ.

ආවරණය කළ සහ පිළියම් කළ පාත්තියක පස් වැඩ සම්පූර්ණ කිරීමේ සීමා හේතුවෙන්, බිම්-පිරවුම් ක්‍රියාත්මක වන අතරතුර මෙම කාර්යය සිදු වේ.



**වැඩි විස්තර ප්‍රජා යාවත්කාලීන කිරීම් පිටුවෙන් ලබා ගත හැකිය.**

# බිම්-පිරවුම් ජීවන චක්‍රය

2040 දෙසැ 31 වන දින තෙක් අඩවියට අපද්‍රව්‍ය භාර ගැනීමට අවසර දෙන සැලසුම් බලපත්‍රයක් බිම්-පිරවුම් සතුව ඇත. වත්මන් පිරවුම් වේගය මත පදනම්ව, 2028 පමණ වන විට අඩවිය පිරවීමට ඉඩ ඇති අතර, අවසාන සමෝච්ඡ ලබා ගැනීම සඳහා ඇස්තමේන්තු ගත මාස හයක අමතර පිරවීම ද මෙයට ඇතුළත් වේ. ජනතා පහසුකම් උදෙසා ඉඩම නැවත කවුන්සිලයට ලබා දෙන විට, සමෝච්ඡ ළඟා කර ගැනීමෙන් අනාගත ඉඩම් භාවිතය පුළුල් වනු ඇත.






## ප්‍රතිචාර

මෙම වෙනස සහ අයදුම් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව ඔබට කිසියම් ප්‍රශ්නයක් තිබේ නම්, කරුණාකර 2026 අප්‍රේල් 30 වන දිනට පෙර අපගේ ව්‍යාපෘති කණ්ඩායම අමතන්න, මන්ද 2026 මැයි මස මුල දී EPA සමාලෝචනය සඳහා මෙම අයදුම් පත්‍රය ඉදිරිපත් කිරීමට Veolia අදහස් කරන හෙයිනි.

## අමතන්න:

**community.vic@veolia.com**

# සංවර්ධන බලපත්‍ර සංශෝධන සමාලෝචනය

සංවර්ධන බලපත්‍ර සංශෝධනයේ අරමුණ වන්නේ, අඩවියේ කේසි කවුන්සිල් සැලසුම් බලපත්‍රය සහ අඩවි පරිසර ආරක්ෂණ අධිකාරිය (EPA) විසින් නිකුත් කරන ලද බලපත්‍ර කොන්දේසිය මගින් අවසර ලැබී ඇති සමෝච්ඡ රේඛා අතර අනුකූලතාවයක් ඇති බව සහතික කිරීමයි.

සංශෝධනය පිළිබඳ විස්තර Veolia විසින් EPA වෙත ඉදිරිපත් කරනු ලැබේ. Veolea සාමාන්‍ය පාරිසරික රාජකාරි බැඳීම්, සෞඛ්‍යය හා පරිසරයට සිදු වෙන හානිය අවම කිරීම සහ ප්‍රජාව හා උනන්දුවක් දක්වන පාර්ශව සමඟ නියැලීම පෙන්නුම් කිරීම ඇතුළු විවිධ සලකා බැලීම් සපුරාලන බව සහතික කිරීම සඳහා EPA විසින් සංශෝධනය සමාලෝචනය කරනු ඇත.

**අපගේ ප්‍රජා යාවත්කාලීන කිරීමේ වෙබ් පිටුවෙන් පරිවර්තන ලබා ගත හැකිය.**

ਅਨੁਵਾਦ ਸਾਡੇਕਮਿਊਨਿਟੀ ਅੱਪਡੇਟ ਵੈੱਬਪੇਜ 'ਤੇਉਪਲਬਧ ਹਨ (Punjabi)

ترجمه ها در صفحه وب بروزرسانی های انجمن ما در دسترس هستند (Dari)

පරිවර්තනය අපගේ ප්‍රජා යාවත්කාලීන කිරීමේ වෙබ් පිටුවේ ඇත (Sinhala)

**අප අමතන්න**: community.vic@veolia.com / 1800 368 737